**මහවැලි ජනාවාස සැලසුම් පදනම පුරාණ ගම්මාන රටාවය. අපේ පැරණි ගම්වල පැවති සහයෝගය, සහජීවනය වැනි උතුම් මිනිස් ගති නොනැසෙන අයුරින් මහවැලි ජනාවාස බිහිවනු ඇත.**

මේ කෙටි ඉතිහාසයේ හැම අවස්ථාවකම වාගේ ගොවි බිම් පිණිස ගොවීන් තේරීම සිදු කරන ලද්දේ දිසාපතිවරුන් විසින් මෙහෙය වන ලද ඉඩම් කච්චේරිවලිනි. මේ ඉඩම් කච්චේරි පිණිස මිනිසුන් ඉදිරිපත් කරන ලද්දේ ගම්මුලාදෑනීන් විසිනි. තම වසම තුළ සිටි අදන්ත සමාජ දූෂකයන් පළාතෙන් පිටමං කර ගැනීම පිණිස පැරණි ගම්මුලාදෑනීන් මෙම ජනපද ව්‍යාපාර උපයෝගී කර ගත් බව පෙනේ.

# ජනාවාස පිළිවෙත

මහවැලි සංවර්ධන මංඩලයේ ප්‍රජා සංවර්ධන නිළධාරි, චන්ද්‍රසිරි සෙනෙවිරත්න විසිනි.

නවසිය තිස් ගණන්වල ගොවි ජනපද ව්‍යාපාර යනු ඉඩම්වල මිනිසුන් පදිංචි කරවීම පමණක් විය. ඒ කාලයේ ඒවායේ පදිංචි කරවීම පිණිස කොහෙන් හෝ මිනිසුන් සොයා ගෙනඒම හැර ඊට වඩා යමක් සිදු වූයේ නැත. මිනිසුන් නව පරිසරයක ජනාවාස කිරීම යනු විශාල භාරදූර කාර්යයකි. ඒ කාර්යය හරිහැටි සංවිධානය නොකිරීම නිසාමදෝ ශ්‍රී ලංකාවේ බිහි කරන ලද ජනපද ව්‍යාපාර සියල්ලම වාගේ විවිධ අංශයන් ගෙන් අසාර්ථක මෙන්ම බොහෝ කොට ප්‍රතිඵල විරහිත ඒවා ලෙස සැලකේ.

මිනිසුන් ජනාවාස කිරීම පිළිබඳ (විශේෂයෙන් ජනපද ව්‍යාපාර ආරම්භය) පළමු ප්‍රයත්නය 1890 වර්ෂයේ කලාවැව ප්‍රදේශයේ ජනපද ව්‍යාපාරය විය හැකිය. එයින් පසුව යළි 1932 වර්ෂය මේ පිළිබඳ වාර්තාගත වර්ෂයක් වූ අතර, මේ රටේ ප්‍රචලිතව ගිය මැලේරියා මර්ධන ව්‍යාපාරය නිසා එය අඩාල වූවායයි විශ්වාස කළ හැකිය. මැලේරියා තර්ජනය තරමක් මර්ධනය වූ පසුව 1939 වර්ෂයේ සිට ජනපද ව්‍යාපාර කටයුතු තරමක් ප්‍රබුද්ධ ලෙස සිදු කර ඇත. එක්දහස් නවසිය තිස් නවය වර්ෂයේ ජනපද වැසියෙකු මඩින් අක්කර 05 ක් ද, ගොඩින් අක්කර 03 ක් ද ලබාගත් අතර, 1953 වර්ෂයේ මෙම ඉඩම් ප්‍රමාණය අක්කර 03 තෙක් අඩු විය. මුල් යුගයේ ඉඩම් ප්‍රමාණය සමඟ ගොවියාට තනා දුන් කුඩා නිවෙස තනා දීමද නතර විය. ඒ වෙනුවට රුපියල් 1,000 ක මුදලක් රජය මගින් ඉඩමේ ගෙයක් ඉදි කර ගැනීම පිණිස ගෙවන ලදි.

ඉතාම අසංකීර්ණ හැඩයක් නොමැති විෂම පරිසරයක්, ජනාවාසයක බිහිවීම හැර මිනිස් පැවැත්ම සමඟ සසඳන කළ ඉහත කී කාලය තුළ මෙරට පිහිටුවන ලද ජනාවාස වළින් හෙවත් ජනපද වලින් සිදුවූ සෙත එතරම් නොවේ.

සාධාරණ මිනිස් පැවැත්ම අවුල් කර ලන, ප්‍රදේශයකට, සාමකාමී ජීවිතයට අහිතකර නායකයන්, ධනපතියන් බිහි වූ අතර, ගොවීන් විසින් හෙලන, වැය කරන ශ්‍රමය විසින් උපදනු ලබන ප්‍රතිඵල වෙනත් අයගේ සුඛ විහරණය පිණිස වෙන් කෙරුනේ ඉතාම ශෝචනීය ආකාරයට ය.

ශ්‍රී ලංකාවේ විශාලම ජනාවාස සහ සංවර්ධන ව්‍යාපාරය වන මහවැලි ගඟ සංවර්ධන ව්‍යාපාරය දියත් කිරීමේ දි හා ජනාවාස සැලසුම් කිරීමේදී ගතවූ යුගය විසින් අසාර්ථක කරන ලද සියළුම ප්‍රයත්නයන් ආදර්ශයට ගන්නා ලදි. සමාජ විද්‍යාත්මක පසුබිමක සිට කරන ලද සමීක්ෂණයක් අනුව රටේ සංස්කෘතික පසුබිම තුළ රඳා පවත්නා තත්වයන් උද කරලීම පිණිස වෙනත් කිසිම ජනපද ව්‍යාපාරයක දක්නට නොමැති පදනමක සිට මහවැලි ව්‍යාපාරයේ ජනාවාස සැලැස්ම සංවිධානය කර ඇත. වෙනත් ව්‍යාපාරයක මෙන් මිනිසුන් සිය නිජබිම වලින් ගෙන වුත් වනාන්තරවල හෙවත් දුෂ්කර පලාතක හෙලා අතරමං කර යාමට වඩා වෙනස්කම් රාශියක් මහවැලි ව්‍යාපාරයේ පදිංචි කරවූ ජනතාව ගේ හිතසුව පිණිස ඇති කර ඇත.

මහවැලි ජනාවාස ක්‍රමයේ මූලික පදනම හෙවත් අඩිතාලම පොකුරු ගම්මානයන් වෙයි. මේ පොකුරු ගම්මානයක් ඉතා කුඩා එකක් වේ. ඉන් එකක පවුල් 100 කට වඩා නොවේ. මෙබඳු පොකුරු ගම්මාන 04 ක් 05 ක් පමණ ඒකරාශි කර විශාල ග්‍රාමයක් සකස් කෙරෙයි. සත්තකින්ම ගම හෙවත් ග්‍රාමය වන්නේ මේ විශාල ගම්මානයි. මේ පොකුරු ගම් හෙවත් කුඩා ගම්මානවල ගොවීන් පදිංචි කරවීමේ දී මෙ රටේ ග්‍රාමීය පරිසරයේ මුල් බැසගත් සම්ප්‍රදායික කල්පනා, කුල ආකල්ප, ශිල්ප ශ්‍රෙණි, සුවිශේෂ ජනවහර, සිතුම් පැතුම් වැනි සමාන උප සංස් කෘතික උරුමයන් ඒකරාශි කර ගත් පුද්ගයලන් ගේ ඒකකයක් නිර්මාණය කර ඇත. මේ ක්‍රමය තුළින් උප ගම්මාන තුළ පැරණි ගම්වල පැවති සහයෝගය සහජීවනය වැනි මූලික මානුෂික ලක්‍ෂණ නොනසා පවත්වා ගෙන යාමට උත් සාහයක් දරන ලදී.

## අත්තම්

ගැමි ජීවිතයේ කෘෂි කටයුතු පිණිස අවශ්‍ය සහයෝගය, සම්බන්ධතාවය ස්ථාපනය කෙරෙන 'අත්තම්' සහ 'කයි' ක්‍රම දිගින් දිගට ම පවත්වා ගෙන යාමට මේ උප සංස්කෘතික සමතාවය බෙහෙවින් උපකාර වෙයි. මෙ පදිංචි කරවීමේ දී 100 ක පමණ පවුල් ප්‍රමාණ යක් ඇතුල් කෙරෙනුයේ එබඳු කුඩා ඒකකයන් තුළ උනුන් වෙත උවමනාකම් සපුරා ගැනීමේ පහසුව වැනි දේ සලකා ගෙනය. කුඩා ගම්මාන 4–5 ක් එක්කර මහා ග්‍රාමයක් කිර්මාණය කිරීම එක් සමාජ විද්‍යාඥයෙකු විස්තර කරන්නේ මෙසේය.

'කුඩා ගම්මාන 4 ක් හෝ 5 ක් ඒකාබද්ධ කොට විශාල ග්‍රාමයක් තැනීම සැලසුම් කර ඇත. මේ විශාල එක් එක් ග්‍රාමයක් සමාජීය සහ සංස්කෘතික වශයෙන් එකම කුලයකට අයත් හෝ එකම ප්‍රදේශයකින් පැමිණි අයගෙන් සමන්විත වීම අවශ්‍ය නොවේ. කුඩා ගම්මාන අතර විවිධත්වයක් වීම හානියක් නොවේ. ඔවුන් ප්‍රවිෂ්ට වී ලැඟුම් ගත් නව ජනාවාසයේ නව ලෝකයේ මේ කුඩා ගම්මාන සැලැස්ම තුළ ඔවුන් ආවේනික උරුමයන් සමඟ ලැගුම් ගන් නවා ඇති හෙයින් මානසික වශයෙන් තනි නොවේ. අනෙක් උප ගම්මානවල තමන්ට වඩා වෙනස් උප සංස්කෘතියක් පැවැතියත්. තම පරිසරයේ නොතනිය සමානකම නිසා පුළුල් පොදු අරමුණු ඉටු කර ගැනීම පිණිස අසමාන අනෙක් ගමක් ගම් කිහිපයත් සමඟ සම්බන්ධ වීමට ඔවුහු මැළි නොකරති. සිය පෞද්ගලික භාවය මෙන් ම පොදු භාවයද මේ තුළින් හෙවත් උප ගම්මාන හා මහා ගම්මාන සංවිධානය තුල මොනවට ආරක්‍ෂා වේ. තම කොටස තුළ පවත්නා ඒකීය භාවයට වඩා විවිධත්වයන් රාශියක් තුළින් මතු වන පොදු කම කාලයක දී අගය කිරීමක් මේ ජනවාස සැලසුම් කරුවන් ප්‍රාර්ථනා කර ඇත.

තම ගම් කොටස තුළ පවත්නා ඒකීය භාවය මෙන් ම අනෙක් ගම්මාන සමඟ පොදු උවමනා කම් උදෙසා අත්වැල් බැඳ ගැනීමේ අගය වටිනා කම ප්‍රායෝගිකව ගොවීන් තේරුම ගනිතැයි යන්න ජනාවාස සැලසුම් කරුවන් අපේක්‍ෂා කළ බව පෙනේ.

මේ හැම උප ගමකටම තැපැල් පෙට්ටිය බැගින් ද, සමූපකාර ප්‍රාදේශිකයක් ද, කණිෂ්ඨ පාසැලක්ද යෝජනා කර ඇත. තැපැල් පෙට්ටිය මගින් විශාල ගම්මානයේ තැපැල් කාර්යාලයට ගම්මුන් ඇද බැඳ තබත්. සමූපකාර ප්‍රාදේශික යන් ප්‍රාථමික සමිතියට සම්බන්ධ වෙයි. කණිෂ්ඨ පාසැලේ ඉගෙන ගන්නා දරුවන් විශාල ගම්මා නයේ මහා විදාලයේදී අනෙක් උප ගම්මානවල දරුවන් සමඟ එක්වෙයි.

සේවා සහ අවශ්‍යතා තුළින් මේ නව ජනාවාස තුළ එකමුතුකම සහජීවනය මෙසේ ගොනුකර සංවිධානය කර ඇත.

## පොදු සේවා

කුඩා ගම්මාන 4–5 අතර විවිධ උප සංස්කෘ තීන් දක්නට ඇතත් පොදු සේවාවන් පරිහරණය කිරීම පිණිස ඔවුනට පොදු බැම්මකට එක්වීමට අනිවාර්යයෙන් ම සිදු වෙයි. ඒ සේවා සහ උවමනාකම් නිසා ජාති, ආගම්, කුල, පළාත් භාෂා බේද හිසේ තබා ගැනීමට මොවුනට මේ සංවිධානය යටතේ නොහැකි වනු ඇත.

මේ ආදර්ශය ජනාවාස සැලසුම්කරුවන් විසින් ලබා ගෙන ඇත්තේ පුරාණ ගම්මාන රටාවෙනි. පුරාණ ගම්මානයක එයට අවශ්‍ය කම්මල් කරුවන්, වඩු කාර්මික යින්, රෙදි සෝදන්නන් ආදී කුල වශයෙන් සම්ප්‍රදාය විසින් වෙන් කළ සියළු ම වාර්ගිකයන් ඇතුළත් වූ අතර, ඔවුන් සියලු දෙනාම ගමක් ලෙස පලාතක් ලෙස එක් ආගමක් අදහන්නන් ලෙසින් පොදු අවස්ථාවල එක්වීම ඉතාම සරල

සිද්ධියක් විය. මේ මිනිස් පැවැත්ම මහවැලි ජනාවාස පැවැත්ම පිණිස උපයෝගී කර ගෙන ඇත.

මේ ගැන විස්තර කරන එක් ස්ථානයක 'ජාති භේද, ආගම් භේද, කුල භේද අපේ සංස්කෘති යෙහි කැපී පෙනෙන විශේෂ ලක්ෂණයන් වී ඇත. සමාජ විද්‍යාත්මක ලෙස සලකා බලන කළ මෙබඳු බෙදීම්වලට තුඩු දුන් කණ්ඩායම් මේ රටේ සංස්කෘතියෙහි උප සංස්කෘතීන් ලෙස කල්පනා කළ යුතුව ඇත. වර්ෂ කීපයක් තුළ නායකත්වය සහ ප්‍රජා බැඳීම් ගැන ජනපද කීප යක කරන ලද සමීක්ෂණයන් ගෙන් ඉස්මතු වූ වැදගත් කරුණක් නම්, සමාජ විවිධත්වයක් ඇති ගම්මානයක ප්‍රජා බැඳීම් ඇති වීමට, එහි වැසියන් එකම සමාජ කොටසක් මිනිස් පවුලක් ලෙස සිතීමට කල්පනා කිරීමට අඩු තරමින් පරම්පරා දෙකක්වත් ගතවෙන බවය. මහවැලි යෝජනා ක්‍රමය වැනි ජාතික මහා ව්‍යාපාරවලින් නියම ප්‍රතිඵල ලබා ගැනීමට පරම්පරා දෙකක් ගතවන තුරු බලා සිටිය නොහැකිය. එම නිසයි, සමාන ජාතිත්වය සහ විවිධ ජාතිත්වය එකට මිශ්‍ර කර ජනාවාස සැලසුම් පිළියෙළ කිරීමට කළේ' යයි විස්තර වෙයි.

මුලින් කෙටියෙන් සඳහන් කළ අයුරු උප ගම්මාන කීපයකින් නිර්මානය කෙරෙන ප්‍රධාන ගම්මානයක මහවැලි සංවර්ධන මණ්ඩලයේ ප්‍රජා සංවර්ධන අංශයේ සැලසුම් යටතේ උප තැපැල් කාර්යාලයක්. පොදු ක්‍රීඩා භූමියක්, පුස්තකාලයක්, සෞඛ්‍ය චිකිත්සාගාරයක්, ජ්‍යෙෂ්ඨ මහා විද්‍යාලයක්, ගොවි පුහුණු මධ්‍යස් ථානයක්, හා සමූපකාර ශාඛාවක් ද පිහිටුවනු ඇත.

මහවැලි ජනාවාස ව්‍යාපාරයේ ගම්මාන සැලැස්ම මෙසේ වන අතර, මෙබඳු විවිධ උප සංස්කෘතියට අයත් උප ගම්මාන 189 ක් මහ වැලි දෙවන පියවරේ පිහිටුවනු ඇත. මෙම උප ගම්මාන 189 ට ප්‍රධාන ගම්මාන 47 ක් සංවිධානය කෙරේ.

මේ ජනාවාස පදනමේ ඊළඟ පියවර කලාප මට්ටමයි. කලාප 09 ක් මෙම අදියර තුළ සකස් කෙරෙයි. මෙම කලාප කේන්ද්‍රයකට සමූපකාර ප්‍රාථමික සමිතියක්, බැංකු ශාඛා, විශේෂයෙන් ග්‍රාමීය බැංකුවක්, ග්‍රාමීය රෝහලක්, මාතෘ නිවාසයක්, වෙළඳ පොලක්, ජ්‍යෙෂ්ඨ මහා විද්‍යාලයක්. වැනි සියළු ම අංග ඇතුළත් වෙයි.

මහවැලි ජනාවාසයන්හි මිනිසුන් පදිංචි කර වීමේ දී ආර්ථික කරුණු, ඉඩම් ප්‍රශ්න ආදී දේ මෙන් ම එතෙක් ජනතාව ජීවත් වූ පරිසර රටාව ඔවුන් ගේ සංස්කෘතික හා උප සංස්කෘතික උරුමනා සියල්ල රැකෙන අයුරෙන් පමණක් නොව ජනාවාස කරවීමෙන් පසුව හිතකර නායකත්වයක් බිහි කෙරෙන අයුරින් පොදු කටයුතු ද සංවිධානය කර ඇත.

**මහවැලි මහවැලි මහාවැලි**
**සිරිපද ලද සමනොල සිරසේ**
**සිඹ සිඹ සිහිලස විඳ සොඳසේ**
**ලෙළී දිළී ගලා බසී**
**මහවැලි ..................**
**ගිරිකුළු විනිවිද නවමං මතුකොට**
**නවලොවකට ඔබ ගලා බසී**
**අතීත රජ රට සිරිසර ඇසහැර**
**ඔබ එනතුරු මග බලා සිටී**
**ලෙළී දිළී ..................**
**මහවැලි ..................**
**සිරිදුව අද මෙහි වඩිනා මඟුලට**
**මහ පාද පියවිලි අතුරා**
**ඔබ බැස එනු දැක හිනැහෙයි සිරිලක**
**අනාගතය කිරි දිය උතුරා**
**මහවැලි..................**

**මහගම සේකර**